# මූල්‍ය ප්‍ර කා ශ න

ලූකා පැසියෝලිගේ දෙවන පරපුර ...

**ගයාන් දිලීප**

## Weekly paper 01

1. නන්දනීගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ වත්කම් රු. 100 000 කින් සහ වගකීම් රු. 20 000 කින් ඉහල ගොස් ඇත. වර්ෂය තුළ නන්දනී විසින් පිරිවැය රු. 10 000 ක තොග පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇති අතර රු. 20 000 ක් වූ බැංකු ණය වාරිකය ඇගේ පෞද්ගලික මුදලින් ගෙවා ඇත.
   2018.03.31 දිනෙන් අවසන් වර්ශය සඳහා නන්දනීගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභා කොපමණ ද ?.
   I. රු. 70 000 III. රු. 120 000 V. රු. 100 000
   II. රු. 90 000 IV. රු. 80 000

2. ජීවන්ත ව්‍යාපාරය රු. 200 000 ක භාණ්ඩ ණයට මිලදීගත් අතර මසකට පසුව රු. 10 000 ක වට්ටමක් ලැබීමෙන් පසුව චෙක්පතක් නිකුත් කර ණයහිමි වටිනාකම පියවන ලදි. නමුත් සතියකට පසුව මෙම චෙක්පත අගරු වී ඇතිබව හඳුනා ගන්නා ලදි.
   ඉහත ගනුදෙනු සටහන් කරන මූලික සටහන් පොත් අනුපිළිවලින් වන්නේ,
   I. ගැණුම් ජර්නලය, මුදල් පාලන ගිණුම, පොදු ජර්නලය
   II. ගැණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය
   III. ගැණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය, පොදු ජර්නලය
   IV. විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය
   V. ගැණුම් ජර්නලය, මුදල් පාලන ගිණුම, මුදල් ලැබීම් ජර්නලය

3. ෆාතිමාගේ ව්‍යාපාරයෙන් පහත තොරතුරු 2018.03.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂයට අදාල වේ.
   - 2017.04.01 තොගය 800 000
   - ගැණුම් 1 200 000
   - විකුණුම් 3 000 000
   - ගෙන ඒමේ කුලී 100 000
   - ආපසු යැවුම් 200 000
   - දළ ලාභය 1 300 000

   **2018.03.31 දිනට ඉතිරි තොගය** වන්නේ,
   I. රු. 200 000 III. රු. 1 700 000 V. රු. 400 000
   II. රු. 1 900 000 IV. රු. 100 000

4. සුනිල්ගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂයට අදාලව පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| | |
|---|---|
| විකුණුම් | 6 000 000 |
| තොගය 2017.01.01 | 400 000 |
| තොගය 2017.12.31 | 600 000 |

ආපසු යැවුම් 200 000

ආයතනය විසින් විකුණුම් මිල මත 20% දළ ලාභයක් පවත්වා ගනී.

දළ ලාභය සහ වර්ෂයේ මිලදී ගැණුම් නිවැරදිව දැක්වෙන පිළිතුර දක්වන්න.

| | **දළ ලාභය** | **ගැණුම්** |
|---|---|---|
| I. | රු. 1 200 000 | 5 600 000 |
| II. | රු. 4 800 000 | 5 200 000 |
| III. | රු. 1 200 000 | 5 200 000 |
| IV. | රු. 5 600 000 | 1 200 000 |
| V. | ඉහත කිසිවක් නොවේ. | |

5. පහත ප්‍රකාශන අතරින් වැරදි ප්‍රකාශය කුමක් ද ?.
   I. වත්කම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කරනුයේ ද්‍රවශීලතාවය මත පදනම්වය.
   II. මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ වත්කම්, වගකීම් සහ හිමිකම් පමණක් ඇතුලත් වේ.
   III. අමතර ප්‍රාග්ධනය සහ ලාභය නිසා අයිතිකරුගේ හිමිකම වැඩි වේ.
   IV. ඉතිරි තොගය ගැලපීමේ දී ඉතිරි තොග ගිණුමට හර කර වෙළෙඳ ගිණුමට බැර කරයි.
   V. සෑම විටම ඉතිරි තොගය පිරිවැය මත අගය කළ යුතුය.

6. ව්‍යාපාර ආයතනයක් විසින් පිළියෙල කරන ආදායම් ප්‍රකාහය සහ මූල්‍ය තත්ව ප්‍රකාශය සම්බන්ධ කරන ප්‍රධාන ගනුදෙනුව වන්නේ,
   I. ගැණිලි
   II. ඉතිරි තොගය
   III. ශුද්ධ ලාභය
   IV. වියදම්
   V. ආදායම්

7. 2018.03.31 දිනට අදාලව පහත තොරතුරු සපයා ඇත.
   - 2018.03.31 දිනට හිමිකම 5 400 000
   - 2018 වර්ෂයේ මුළු ආදායම් 7 000 000
   - 2018 වර්ෂයේ මුළු වියදම් 3 000 000
   - 2018 වර්ෂයේ ගැණිලි 1 200 000
   - 2018 වර්ෂයේ යෙදවූ ප්‍රාග්ධනය 600 000

   2017.04.01 දිනට ප්‍රාග්ධනය / හිමිකම ගණනය කරන්න.

   ..........................................................................................................

8. සෑම මූල්‍ය ප්‍රකාශනයක් පිළියෙල කිරීමේ දී ව්‍යාපාරයේ නම සටහන් කිරීමට අදාල ගිණුම්කරණ සංකල්පය වන්නේ,
   I. මූල්‍ය මිණුම් සංකල්පය
   II. සංගතතා සංකල්පය
   III. ගැලපුම් සංකල්පය
   IV. උපචිත සංකල්පය
   V. ඒකක සංකල්පය